# ගුවන් විදුලි වැඩසටහන් කෙරෙහි ශ්‍රාවක රුචිකත්වය ගොඩනැංවීමෙහිලා බලපාන සාධක පිළිබඳ විමර්ශනයක්

ස.කථි. අමාලි උත්පලා නන්දසිරි
ජනසන්නිවේදන අධ්‍යයන අංශය
කැලණිය විශ්වවිද්‍යාලය.

**CITATION** - Nandasiri, Amali Uthpala. (2014). An Analysis on establishing the taste of licensers to Radio Programmes. 2nd Research Symposium of Temporary Acadamic Staff. 23rd January 2014. Faculty of Social Sciences. University of Kelaniya, Sri Lanka. Abstracts. Page 16

## Abstract

ග්‍රාමීය ජනතාවගේ විවිධ අවශ්‍යතා පූර්ණය කිරීම උදෙසා ගුවන් විදුලි මාධ්‍ය උපයෝගී කරගැනීම පිළිබඳ ලොවපුරා විද්වතුන් නොයෙක් අධ්‍යයන සිදුකර ඇත. නමුත් ලංකාවේ ග්‍රාමීය ජනතාව කේන්ද්‍ර කරගනිමින් ගුවන් විදුලි වැඩසටහන් ක්‍රියාත්මක වීම පිළිබඳ සිදුකර ඇති අධ්‍යයන ප්‍රශස්ත මට්ටමක නොපවතියි. එබැවින් ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ශ්‍රාවකයාගේ රුචිකත්වය හා ඒ කෙරෙහි බලපාන සාධක නිසි පරිදි හඳුනා ගැනීම මෙම අධ්‍යයනයේ අරමුණයි. ග්‍රාමීය ජනතාව ඉලක්ක කරගත් වැඩසටහන් හා ඒවායෙහි අන්තර්ගතය, ශ්‍රාවක රුචිකත්වය ගොඩනැංවීමෙහි ලා ගතයුතු ක්‍රියාමාර්ග යනාදිය විමර්ශනය කිරීම මෙම අධ්‍යයනයෙහි සෙසු අරමුණු අතර වේ.

මෙවැනි පසුබිමක් තුළ වැඩසටහන් සම්පාදකයින් ශ්‍රාවක රුචිකත්වය නිසි පරිදි හඳුනා නොගැනීම ග්‍රාමීය ජනතාව ගුවන් විදුලිය වෙතින් දුරස්වීමට හේතු වී තිබේද? යන්න විමසා බැලිය යුතු ය. ඒ සඳහා සිදුකළ අධ්‍යයනයෙහි පර්යේෂණ ක්ෂේත්‍රය වන්නේ, උතුරු මැද පළාතේ, ඉපලෝගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් මහඉලුප්පල්ලම, සේනපුර, ගලගෙදරගම ග්‍රාම නිලධාරී වසම් තුනට අයත් ග්‍රාමීය ප්‍රදේශයන් ය. ප්‍රශ්නාවලි හා සම්මුඛ සාකච්ඡා පර්යේෂණය සඳහා භාවිත ක්‍රමවේද විය. ඉහත ග්‍රාම නිලධාරී වසම්හි ගෘහ මූලික ලැයිස්තු ඇසුරින් සම්භාවිතා නොවන අහඹු නියැදි ක්‍රමය යටතේ ගෘහ ඒකක දෙසීයක් ග්‍රාහක සමීක්ෂණය සඳහා උපයෝගී කර ගැනුණි. එසේ ම, ග්‍රාම නිලධාරී වසම් තුනම නියෝජනය වන පරිදි සම්මුඛ සාකච්ඡා විස්සක් ද සිදුකෙරිණි.

ගුවන්විදුලි ශ්‍රවණය පිළිබඳ ග්‍රාමීය ජනතාවගේ රුචිකත්වය හඳුනා නොගැනීමෙන් ශ්‍රාවකයා ගුවන් විදුලියෙන් දුරස් වී ඇති බව පෙනීයයි. ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතාවන්ට මූලිකත්වය දීමට වඩා මාධ්‍ය හිමිකාරීත්වයේ ආර්ථික හා දේශපාලන අභිප්‍රායයන් කේන්ද්‍ර කරගෙන නිර්මාණය කළ ගුවන්විදුලි වැඩසටහන් නිසා ශ්‍රාවකයාගේ අවශ්‍යතා සීමා වී ඇත. මෙහිදී ශ්‍රාවකයා ආර්ථික වාසි ලබාගැනීම, විනෝදවීම සහ අධ්‍යාත්මික සහනශීලීත්වයක් ලැබීම යනාදී අරමුණු සඵල කරගැනීම සඳහා ගුවන් විදුලිය ශ්‍රවණයට යොමුවීමේ ප්‍රවණතාවක් හඳුනාගත හැකිය. එමෙන් ම ගුණාත්මක වැඩසටහන්හි අවශ්‍යතාවක් සමාජය හමුවේ පවතින බව අධ්‍යයනය මඟින් පැහැදිලි විය. මීට අමතරව, ග්‍රාමීය ජනතාවගේ අවශ්‍යතා හඳුනාගත්, ඔවුන්ගේ නිරූපණයක් සේ පෙනී සිටින ප්‍රජා ගුවන් විදුලි මාධ්‍යයක වටා පෙළගැසීමට ග්‍රාමීය ප්‍රජාවගේ වැඩි ප්‍රතිශතයක් කැමැත්තක් දක්වයි.

ඒ අනුව ග්‍රාමීය සමාජය සංවර්ධනය කිරීමෙහිලා උපයුක්ත නව ගුවන් විදුලි වැඩසටහන් වෙත යොමුවීම කාලෝචිත වූවකි. එමගින් උසස් මට්ටමේ ශ්‍රාවක රුචිකත්වයක් ගොඩනැංවීමට හැකියාවක් තිබේ.

**මුඛ්‍ය පද** - ගුවන් විදුලිය, ශ්‍රාවක රුචිකත්වය, ග්‍රාමීය ප්‍රජාව, සංවර්ධනය, ගුවන් විදුලි වැඩසටහන්